# ශ්‍රී ලංකාවේ රුධිර පාරවිලයන සේවාව

## වෙනස්කොට සැලකීමට ලක් කරන මාර්ගෝපදේශයන් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගත යුතුයි.



ශ්‍රී ලංකාවේ ජාතික රුධිර පාරවිලයන සේවාව (NTBS) මඟින් ප්‍රකාශයට පත් කර ඇති, වර්තමානයේ භාවිතා වන රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ වල දැක්වෙන ආකාරයට, රුධිර දායකයකු ඇතැම් 'අවදානම්කාරී හැසිරීම්වලින්' තොර පුද්ගලයකු විය යුතුය. මෙම මාර්ගෝපදේශ විසින් සමරිසි සහ ද්වීරිසි පුරුෂයන් මෙන්ම ලිංගික වෘත්තියේ නියැලෙන පුද්ගලයන්ව වෙනස්කොට සැලකීමට ලක් කරනු ලබයි.

PUBLICATION BY:
BRIDGE to EQUALITY
සමානාත්මතාවය සොයා...
சமத்துவத்தை தேடுதல்...

# පටුන


i. සාරාංශය

ii. සිද්ධි අධ්‍යයනය


iii. ලේ දන්දීම

iv. නිගමනය

v. නිර්දේශ

**ඇමුණුම I: ලොව වටා පවතින ප්‍රතිපත්ති සංවර්ධන**

**ඇමුණුම II: ලේ දන්දීම සඳහා වන මාර්ගෝපදේශ සහ ප්‍රකාශය**


*පින්තූරය 1: ජාතික රුධිර පාරවිලයන සේවය විසින් සපයනු ලබන "ලේ දන්දීමේ වාර්තා පොත"*

# I. සාරාංශය

රුධිරය පරිත්‍යාග කිරීම, මරණයෙන් ජීවිත ගලවා ගැනීමට දායක වේ. ලෝක සෞඛ්‍ය සංවිධානය පවසන්නේ, පුද්ගලයකු වෙත ලබා දිය හැකි වටිනාම ත්‍යාගය රුධිර පරිත්‍යාගය බවයි.

ශ්‍රී ලංකාවේ ජාතික රුධිර පාරවිලයන සේවාව (NTBS) මගින් ප්‍රකාශයට පත් කර ඇති, වර්තමානයේ භාවිතා වන රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ වල දැක්වෙන ආකාරයට, රුධිර දායකයකු ඇතැම් 'අවදානම්කාරී හැසිරීම්වලින්'[1] තොර පුද්ගලයකු විය යුතුය. ලිංගික සහකරුවන් එක් අයකුට වඩා සිටීම, පිරිමින් පිරිමින් සමඟ ලිංගිකව හැසිරීම (MSM), "ලිංගික වෘත්තියේ" අවම වශයෙන් එක් වරක් වත් නියැලී තිබීම, ඉකුත් වසර තුළ "අවදානම්කාරී ලිංගික හැසිරීමක" නියැලී තිබීම, සහ එක් වරක් වත් එන්නත් කටු හරහා මත්ද්‍රව්‍ය එන්නත් කර ගෙන තිබීම, ආදී ක්‍රියාකාරකම් 'අවදානම්කාරී හැසිරීම්' ලෙස දැක්වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම පුද්ගලයන් "අවදානම්කාරී හැසිරීම්වලට" නැඹුරු අය යැයි වර්ගීකරණය කිරීමක් සිදුවන අතර, ඒ හරහා මෙම මාර්ගෝපදේශ විසින් සමරිසි සහ ද්වීරිසි පුරුෂයන් මෙන්ම ලිංගික වෘත්තියේ නියැලෙන පුද්ගලයන්ව වෙනස්කොට සැලකීමට ලක් කරනු ලබයි.
වීඑ පරිත්‍යාගශීලීන්ට, ඔවුන්ගේ ලිංගික දිශානතිය පිළිබඳ වංක වීමට දිරිමත් කරනා බැවින්, මෙම මාර්ගෝපදේශ වල දැක්වෙන ආකාරයේ ලිංගික දිශානතිය පදනම් කරගත් 'අවදානම්කාරී හැසිරීම්', වැරදි ප්‍රතිඵලයන් ගෙන දෙන බව අපගේ සිදුවීම් අධ්‍යයනයෙන් පෙන්නුම් කරයි. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කර ඇති පරිදි, සෑම රුධිර පරිත්‍යාගයක්ම, NBTS විසින් HIV, හෙපටයිටිස් B සහ C, සිපිලිස් සහ මැලේරියා පරීක්ෂණයකට යොමුකරයි. මෙමගින්, ලිංගික දිශානතිය මත පදනම් වූ  රුධිර පරිත්‍යාග තහනම් කිරීමේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප වෙයි.

රුධිර පරිත්‍යාග කිරීමට සැපිරිය යුතු සුදුසුකම්, වෙනස්කොට සැලකීම අවම කිරීම සඳහා, ලෝක ව්‍යාප්තව රුධිර පරිත්‍යාග නීති යාවත්කාලීන වීම සිදු වෙයි. මෙම නීතිරීතිවලට අනුව මාස තුනක් හෝ ඊට වැඩි කාලයක් එකම සහකරුවෙක් සමග සිටි වීඑ පුද්ගලයකුට රුධිරය පරිත්‍යාග කිරීමට අවසර ඇත.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සියලු පුද්ගලයන්ට සමානාත්මතාවයෙන් සැලකුම් ලැබීමට සහ වෙනස් කොට සැලකීමෙන් වැළකීමට ඇති අයිතිය සහතික කරයි. මෙයට MSM සහ ලිංගික වෘත්තියේ නියැලෙන්නන් ද ඇතුළත් වේ. NBTS විසින් එහි යල් පැන ගිය මාර්ගෝපදේශ සමාලෝචනය කළ යුතු වන අතර, ඒවා මෑත කාලීනව ලෝකය තුළ සිදු වූ වර්ධනයන් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වන පරිදි නැවත සකස් කළ යුතු වේ.

[1] http://www.nbts.health.gov.lk/index.php/component/k2/itemlist/search?searchword=risk+&categories=


2016 ජනවාරි වන විට, පරිත්‍යාගශීලීන් තේරීමේ නිර්ණායකයනට අනෙකුත් නිර්නායකයන් සමග පරිත්‍යාගශීලින් " අවදානම්කාරී හැසිරීම්" වලින් නිදහස් විය යුතු බව දක්වා ඇත. "අවදානම්කාරී හැසිරීම්" හඳුනාගෙන ඇත්තේ සමරිසි පුද්ගලයන්, ලිංගික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන්, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන්, සහ ඉහත සඳහන් ඕනෑම අයෙකු සමඟ ලිංගිකව එක්වීම, එමෙන්ම එක් ලිංගික සහකරුවෙකුට වඩා වැඩි ගණනක් සිටීම යනාදියයි. කෙසේ වෙතත්, අපගේ සිද්ධි අධ්‍යයනය තුල සපයා ඇති ජාතික රුධිර පාරවිලයන සේවයෙහි ලේඛනයේ දැක්වෙන්නේ "අවදානම්කාරී හැසිරීම්' යනු ඉදිකටු භාවිතයෙන් මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයින් (මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් නොවේ), පිරිමින් සමඟ ලිංගිකව එක්වන පිරිමින් (සමලිංගිකයන් නොවේ), කිසියම් අවස්ථාවක ලිංගික සේවය ලබා දී ඇත්නම් (ලිංගික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් නොවේ) යනාදියයි. මාර්ගෝපදේශ වල විෂමතාවයක් ඇති බව මෙයින් පෙන්නුම් කෙරේ

# II. සිද්ධි අධ්‍යයනය

ජේන්*[2] 25 හැවිරිදි ද්වි-රිසි පිරිමියෙකි. ලේ පරිත්‍යාග කිරීමේදී ඔහු MSM ලෙස හඳුනා ගනී. ජේන් හෘද සාක්ෂියට එකඟ පුරවැසියෙකි. එසේම ඔහු සෑම මාස තුනකට වරක් රුධිරය පරිත්‍යාග කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. ඔහු 30 වතාවකට වඩා රුධිරය පරිත්‍යාග කර ඇති අතර, හදිසි අවස්ථා වලදී රුධිරය ලබා දීමට කැඳවීම් ද ලැබී ඇත. ඇතැම් විට මාස තුන අවසන් වීමටත් පෙර ඔහුට හදිසි ඇමතුම් ලැබී ඇත.

### ලේ දන්දීමේ වාර්තාව

සෑම රුධිර පරිත්‍යාගශීලියෙකුටම, ජාතික රුධිර පාරවිලයන සේවය මගින්, රුධිර පරිත්‍යාගශීලීන්ගේ පොතක් ලබාදේ. එය එක් පරිත්‍යාගශීලියෙකු සඳහා තනි Barcode එකකින් සමන්විත වේ. එක් පොතක් අවසන් වූ පසු, එය පද්ධතියට එක් කිරීමට නැවත ලබා දෙන අතර, පැරණි පොත වෙනුවට නව පොතක් හිමිවෙයි. පරිත්‍යාගයක් අතරතුර, පොතේ Barcode එක Scan කර ගන්නා " පරිත්‍යාග අංකය" සහිත ස්ටිකරයක් ලබා දෙයි. සෑම පරිත්‍යාගයකටම පසු ලේ දන්දීමේ වාර්තාව වෛද්‍යවරයෙකු විසින් අත්සන් කරනු ලැබේ.




පින්තූරය 2: ජේන්ගේ ලේ දන්දීමේ වාර්තාව

ජේන් ලේ පරිත්‍යාග කරන සෑම අවස්ථාවකම පෝරමයේ MSM ලෙස සටහන් කලද, එය අවදානම්කාරී හැසිරීමක් ලෙස සැලකේ. ඔහුගේ රුධිර වර්ගය දුර්ලභ නිසා සහ වැඩි ඉල්ලුමක් ඇති බැවින් ඔහු දිගටම රුධිර පරිත්‍යාගය සිදු කරයි. ජේන් ලේ දන්දීමේ කඳවුරුවලට සහභාගි වන්නේ, ඒවා ගැන පෝස්ටර් දකින විට හෝ NBTS වෙතින් SMS මගින් ඔහුට පරිත්‍යාග කඳවුරක් ගැන දැනුම් දුන් විටය. ඔහු විවිධ ලේ බැංකුවලට ද ලේ ලබා දී ඇත.


ජේන් තමා MSM ලෙස සටහන් කරන විට, වෛද්‍යවරයා ඔහුගෙන් "ඔහුට සහකරුවන් කී දෙනෙක් සිටියාද..?" යන්න සහ "ඔහුට පෙර මාස තුන තුළ සහකරුවන් කිහිප දෙනෙකු සිටියාද..?" වැනි ප්‍රශ්න අසයි. HIV වැනි රෝග ඇත්දැයි බැලීමට, රුධිරය අනිවාර්යයෙන් පරීක්ෂා කරන බැවින් ඔහුට සහකරුවන් කිහිප දෙනෙකු සිටියද එය ගැටලුවක් නොවන බව පරිත්‍යාග කඳවුරුවල වෛද්‍යවරු ඔහුට පවසා ඇත. වෛද්‍යවරුන් ඔහුට පවසා ඇත්තේ, 2015 -16 වැනි කාලයේ සිට NBTS විසින් අනුගමනය කරන වත්මන් ප්‍රතිපත්තිය, යල් පැන ගොස් ඇති බවයි. රුධිරය පරිත්‍යාග කිරීමේදී MSM ලෙස සටහන් කිරීම සම්බන්ධයෙන් හෙදියන්ට පවා කිසි දිනක ගැටලුවක් නොතිබූ බව ජේන් ප්‍රකාශ කරයි.

යාවත්කාලීන වුණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමට තම අකමැත්තක් නොමැති බව වෛද්‍යවරුන් පවසා සිටිය ද, පරිත්‍යාග කඳවුරුවල, පළමු මහජන සම්බන්ධතා ස්ථානය වන, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු (PHI) විසින්, තමාව රුධිරය පරිත්‍යාග කිරීමෙන් වැළැක්වීමට උත්සාහ කළ සිදුවීම් දෙකකට ජේන් මුහුණ දී තිබේ.

[2] ජේන් යනු ඔහුගේ සැබෑ නම නොවේ. 2022 නොවැම්බර් මස Bridge to Equality විසින් ජේන්ව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී.

## සිද්ධිය 1:

2020 ජුලි මාසයේදී, ශේන් සහ ඔහුගේ මිතුරා (ඔහු ද MSM අයෙකු ලෙස හඳුනාගෙන ඇත) CIB සමාගම විසින් හොරණ ප්‍රදේශයේ දී පවත්වන ලද වාර්ෂික ලේ දන්දීමේ කඳවුරට සහභාගී විය. ජාතික රුධිර පාරවිලයන සේවය විසින් නිකුත් කරන ලද නිල පෝරමයක් ඔවුන්ට ලබා දී ඇති අතර එමගින් ඔවුන්ගේ වෛද්‍ය සහ චර්යාත්මක අතීතය පිළිබඳ ප්‍රශ්න ලැයිස්තුවක් අසන ලදී. ෂේන් පෝරමයේ සඳහන් කර තිබුණේ ඔහු MSM බවයි. ඔහුගේ රුධිරය දුර්ලභ රුධිර සණයක් වන O- ප්‍රභේදයට අයත් බව ඔහු පෙන්වා දී ඇති අතර, කඳවුරට ද මෙම රුධිර සණය අවශ්‍ය වී තිබුණේ, ඔවුන් එම රුධිර සණය සම්බන්ධ හිඟයකට මුහුණ දී සිටින බැවිනි. ඔහු තම පෝරමයත්, කඳවුරේ PHI වෙත ඉදිරිපත් කළ විට, ඔහු MSM නිසා රුධිරය පරිත්‍යාග කිරීමට ඉඩ නොදෙන බවත්, රුධිරය දන්දීමට අවශ්‍යනම් පෝරමයේ ඇති MSM බව පිළිගැනීමේ සඳහන, ඉවත් කරන ලෙස ද ඔහුට දන්වා ඇත.




පින්තූරය 3: ෂේන්ගේ ලේ දන්දීමේ වාර්තාව

ෂේන්ගේ ලේ දන්දීමේ වාර්තාව පරීක්ෂා කිරීමේදී ඔහු මීට පෙර බොහෝ වාරයක් රුධිරය පරිත්‍යාග කර ඇති බව PHI ට පෙනී යන්නට ඇත. එසේ වුවත් තම තීරණය වෙනස් නොකල මේ නිළධාරියා, ෂේන්ට අවස්තාව ලබා නොදුන්නේය.

ෂේන්ගේ අභිප්‍රාය වූයේ සමාජ සේවයක් කිරීම නිසාත්, ඔහුගේ දුර්ලභ රුධිර සණය මගින් ජීවිතයක් ආරක්ශා කිරීමේ අරමුණ ඉටු කර ගැනීම නිසාත්, ඔහු MSM ලෙස පිළිගැනීම ඉවත් කළේය. එය ඵල රහිත ක්‍රියාවක් බව ඔහු පවසන්නේ, එය රුධිරය පරිත්‍යාග කිරීමේ දී කලින් පුරවන ලද ආකෘති පත්‍රවලට පටහැනි වන නිසාය. රුධිරය එකතු කරන වෛද්‍යවරයාට මේ බව හෙළි නොකරන ලෙසත් PHI විසින් ඔහුට දැනුම් දුන් නමුත්, ඔහු අවංකව වෛද්‍යවරයාට දන්වා සිටියේ තමන් මෙම පෝරමයට අසත්‍ය කරුණු ලබා දුන් බවයි. ඔහුගේ Barcode එක Scan කර ඔහුගේ තොරතුරු තහවුරු කර ගැනීමට ද වෛද්‍යවරයාට හැකි විය.

**ඔහුගේ මිතුරා ඔහු MSM බව ඔහුට ලබා දුන් පෝරමයේ සඳහන් කර නොතිබූ අතර ඔහු හට නිදහසේ රුධිරය පරිත්‍යාග කිරීමට අවසර දී ඇත.**

## සිද්ධිය 2:

2022 සැප්තැම්බර් මාසයේදී ෂේන් හොරණ මොරගහහේන ශ්‍රී පූර්වාරාම මහා විහාරයට ගියේ මොරගහහේන පොලිස් ස්ථානය විසින් සංවිධානය කරන ලද ලේ දන්දීමේ කඳවුරකට සහභාගී වී ලේ දන් දීමටය. ෂේන් ලේ දන්දීමෙ පෝරමයේ තමා MSM ලෙස සටහන් කර තිබුණි. PHI ඔහුට පැවසුවේ ඔහු MSM නොවන ලෙස ඔහුගේ විස්තරය වෙනස් කරන තුරු ඔහුට ලේ පරිත්‍යාග කිරීමට ඉඩ නොදෙන බවයි. ෂේන් මෙයට එකඟ වූයේ නැත, එය පහත් හා නින්දා සහගත යැයි ඔහුට හැඟුණි. ඔහු සාමාන්‍ය පරිත්‍යාගශීලියෙකු බවත් ඔහුගේ සියලු තොරතුරු පද්ධතිය තුළ පවතින බවත් ඔහු PHI ට පැවසූ නමුත් PHI එය ප්‍රතිපත්තිය බවත් ඒ වෙනුවට ෂේන් වෙනත් පෝරමයක් පුරවන ලෙසත් ප්‍රකාශ කළේය. ෂේන් දිගින් දිගටම තම මතය ප්‍රකාශ කරන විට, අසල සිටි පොලිස් නිලධාරියෙක් ඔවුන් වෙත පැමිණ, පෝරමයට ලබා දුන් ඔහුගේ විස්තරය වෙනස් කරන ලෙස ඉල්ලා සිටියේය. අවසානයේ ෂේන් මෙම ඉල්ලීමට අවනත වූ අතර ඔහු MSM නොවන අයෙකු ලෙස පෝරමයේ සඳහන් කළේය. නමුත් කඳවුරේ වෛද්‍යවරයා ඔහුට පැවසුවේ එය කිසිසේත්ම ප්‍රශ්නයක් නොවන බවයි. වෛද්‍යවරයා, HIV පරීක්ෂාවට අදාළ ප්‍රශ්න ඔහුගෙන් ඇසුවා පමණක් නොව, සියලුම රුධිර සාම්පල පරීක්ෂා කරන බවත්, ලේ බැංකුව විසින් ඔහුව අමතා ඔහුගේ රුධිරයේ කිසියම් ගැටලුවක් ඇත්නම් දන්වනු ඇති බවත් ෂේන්ට දන්වා සිටියේය.

ඔහු MSM බව ප්‍රකාශ කල විට වෛද්‍යවරුන් සහ අනෙකුත් නිලධාරීන් පවා ඔහුගේ රුධිරය පිළිගැනීමට සූදානම්ව සිටින විට, ඇතැමෙකුට ඔහුගේ ලිංගික දිශානතිය ගැටලුකාරී වන්නේ මන්දැයි ෂේන් ප්‍රශ්න කරයි. ප්‍රතිපත්ති සහ භාවිතය අතර වෙනසක් ඇත්තේ මන්දැයි ඔහු විමසයි. රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ සහ ඒ හා සම්බන්ධ පෝරමයන් මිනිසුන්ව තම ලිංගික දිශානතිය සැඟවීමට දිරිමත් කරන බව ද, එමගින් එවැනි නීති හඳුන්වාදීමේ අරමුණු නැසෙනා බව ද ඔහුගේ අදහසයි.

තමා දිගටම ලේ පරිත්‍යාග කරන බව ෂේන් තහවුරු කරයි. ඔහු මීට පෙර ඩුබායි හි ජීවත් වූ අතර එහිදී ලේ පරිත්‍යාග කර ඇත. ඔහු MSM වීම ගැන ඩුබායි හි වෛද්‍යවරුන්ට ප්‍රශ්නයක් නොවීය.

ෂේන් තමා මුහුණ දුන් වෙනස් කොට සැලකීමේ (ඉහත සඳහන් කළ) සිදුවීම් දෙක සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) වෙත පැමිණිලි කර ඇත. නඩු විභාග වෙමින් පවතී.

# III. ලේ දන්දීම

ශ්‍රී ලංකාවේ, ජාතික රුධිර පාරවිලයන සේවය (NBTS) විසින් ප්‍රකාශයට පත් කරන ලද වර්තමාන රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශවල සඳහන් වන්නේ රුධිර පරිත්‍යාගශීලියෙකු "අවදානම්කාරී හැසිරීම්" වලින් නිදහස් විය යුතු බවයි. ලිංගික සහකරුවන් එක් අයකුට වඩා සිටීම, පිරිමින් පිරිමින් සමඟ ලිංගිකව හැසිරීම (MSM), "ලිංගික වෘත්තියේ" අවම වශයෙන් එක් වරක් වත් නියැලී තිබීම, ඉකුත් වසර තුළ "අවදානම්කාරී ලිංගික හැසිරීමක" නියැලී තිබීම, සහ එක් වරක් වත් එන්නත් කටු හරහා මත්ද්‍රව්‍ය එන්නත් කර ගෙන තිබීම, ආදී ක්‍රියාකාරකම් 'අවදානම්කාරී හැසිරීම්' ලෙස දැක්වේ. මෙම මාර්ගෝපදේශ හරහා, සමරිසි හා ද්වි-රිසි පිරිමින්ට මෙන්ම ලිංගික ශ්‍රමිකයන්ට වෙනස් කොට සැලකීමක් සිදු වන අතර, එමගින් පුද්ගලයින් කාණ්ඩයක් විශේෂ කොට, අනිවාර්යයෙන් අවදානම්කාරී හැසිරීම් වලට ගොදුරු වන අය ලෙස වර්ගීකරණය කර, ඔවුන්ට රුධිරය පරිත්‍යාග කිරීම සම්බන්ධව ජීවිත කාලයටම බලපාන අයුරේ තහනමක් පැනවේ.

HIV පිළිබඳ නව තාක්ෂණය සහ අවබෝධය නිසා, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සහ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි, ලොව පුරා රටවල රුධිර පරිත්‍යාග පිළිබඳ ජාතික මාර්ගෝපදේශ ප්‍රතිසංස්කරණය කිරීමට හැකි බව, විවිධ උදාහරණ පෙන්නුම් කරයි. ගුද සංසර්ගය HIV පැතිරීම සඳහා ඉහළ අවදානමක් සහිත හේතුවක් ලෙස සලකනු ලබන නමුත්, ගුද සංසර්ගය සමරිසි යුවළ වලට පමණක් සීමා වන්නක් නොවේ. ඕනෑම කෙනෙකුට "අවදානම්කාරී හැසිරීම්" වල යෙදිය හැක. එයට ලිංගික දිශානතියෙහි බලපෑමක් නැත. නමුත් සමරිසි සහ ද්වි-රිසි පිරිමින් සහ ලිංගික ශ්‍රමිකයින් රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ තුල "අවදානම්කාරී හැසිරීම්" ඇති අය ලෙස සඳහන් කර ඇති අතර, මෙය ඔවුන්ගේ අභිමානයට තර්ජනයකි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන (NSACP) තහවුරු කරන්නේ, MSM ජනගහනය හරහා HIV සම්ප්‍රේෂණය වැඩි වීමට 'සමරිසි හැසිරීම්'[3] වල බලපෑමක් නොමැති බවයි.

ලොව පුරා රටවල්, රුධිර පරිත්‍යාගශීලීන්ගේ සුදුසුකම් පිළිබඳව තිබූ යල් පැන ගිය සුදුසුකම් වලින් ඔබ්බට ගොස් ඇති අතර, MSM පිරිමින් හට රුධිර පරිත්‍යාග කිරීම පිළිබඳ සීමාවන් ලිහිල් කර තිබේ.[4] එක්සත් රාජධානියේ ක්‍රියාකාරීන් විසින් ගෙනගිය 'Donation not Discrimination' ව්‍යාපාරයෙන් පසුව, 2021 වසරේ දී රුධිර පරිත්‍යාග නීතිවලට සංශෝධනයක් ගෙන එන ලදී. ප්‍රංශය, කැනඩාව, ඉතාලිය, ස්පාඤ්ඤය සහ ඊශ්‍රායලය ඇතුළු වෙනත් රටවල රුධිර පරිත්‍යාග ප්‍රතිපත්තියේ වෙනස්කම් සිදු කර ඇත. මෑතකදී, ජර්මනිය ප්‍රකාශ කළ පරිදි, එහි රුධිර පරිත්‍යාග ප්‍රතිපත්තීන් වලට ගෙන ආ සංශෝධන මෙම වසරේ අප්‍රේල් මස සිට ක්‍රියාත්මක වෙයි.[5]

ඉහත සඳහන් රටවල ලේ දන්දීමේ නීති සරල කර ඇත. ලේ දන්දීමේ සුදුසුකම් පදනම් වන්නේ, පරිත්‍යාගශීලියා අයත් වන කිසියම් වර්ගයක් මත නොව, පරිත්‍යාගශීලියාගේ පෞද්ගලික අත්දැකීම් මතය .

[3] http://www.aidscontrol.gov.lk/images/publications/NSACP_Annual-Report_2019.pdf

[4] කරුණාකර ඇමුණුම එක බලන්න.

[5] https://news.abs-cbn.com/overseas/01/11/23/germany-pushes-to-end-gay-blood-donor-discrimination
සමාජභාවය කුමක් වුව ද, යමෙක් පෙර මාස තුන තුළ නව සහකරුවෙකු හෝ බහු සහකරුවන් සමඟ ගුද සංසර්ගයේ යෙදුනේ නම්, ඔවුන්ට පරිත්‍යාග කිරීමට පෙර මාස තුනක් බලා සිටීමට සිදුවනු ඇත. මේ අනුව, එකම සහකරු සමග මාස 3ක් හෝ ඊට වැඩි කාලයක් සිටි MSM පුද්ගලයන් හට රුධිරය පරිත්‍යාග කිරීමට කිසිඳු අවහිරයක් නොමැත.

## නීතියේ සඳහන් වනුයේ කුමක්ද?

සමරිසි සහ ද්වීරිසි පිරිමින් දැනටමත් විවිධ සමාජ අපහාසයන්ට සහ සාපරාධීකරණය ඇතුළු වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන් කිහිපයකට දැනුදු මුහුණ දෙයි. 1883 ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ[6] යන වගන්ති පිළිවෙළින් "ස්වභාවධර්මයේ අනුපිළිවෙලට එරෙහිව සිදුවන ලිංගික සංසර්ගය" සහ "දරුණු අශෝභන ක්‍රියාවන්" අපරාධ ලෙස හඳුන්වයි. දණ්ඩ නීති සංග්‍රහය තුල එම වගන්ති පිළිබඳ නිසි අර්ථ දැක්වීමක් සපයා නොමැති වුවද, සමරිසි ලිංගික සම්බන්ධතා අපරාධයක් ලෙස සැලකීමට මෙම වගන්ති දෙකම භාවිතා කර ඇත. මෙම 'අපරාධ' සම්බන්ධයෙන් වැරදිකරුවන් වන අයට වසර දහයක් දක්වා සිරදඬුවම් හිමිවිය හැකිය.

ශ්‍රී ලංකාව සෑම මූලික ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුමකම පාර්ශවකරුවෙකි. එබැවින්, මෙම ගිවිසුම් යටතේ ආරක්ෂා කර ඇති සමානාත්මතාවය සහ වෙනස් කොට සැලකීම සිදු නොකිරීම පිළිබඳව අයිතිවාසිකම්, MSM පිරිමින්ට සහ ලිංගික ශ්‍රමිකයන් ඇතුළු සියලුම ශ්‍රී ලාංකිකයන්ට අදාළ වේ. 2006 යෝග්‍යකර්තා මූලධර්ම යනු ලිංගික දිශානතිය සහ සමාජභාවය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ කරුණු අඩංගු මූලධර්ම සමූහයකි. 2017 දී, යෝග්‍යකාර්තා මූලධර්ම +10 (YP+10) සම්මත කරන ලදී. එහි, ඉහළම සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම (17 වැනි යෝග්‍යකර්තා මූලධර්මය) සම්බන්ධව සිදු වන කරුණු දැක්වීමේදී, රාජ්‍යය සතු අනෙකුත් බැඳීම් පිළිබඳ සඳහන් වේ. YP+10 මගින් දැක්වෙන පරිදි රාජ්‍යය, "රුධිරය, ජන්මානු, කළල, අවයව, හෝ වෙනත් පටක පරිත්‍යාගකිරීමේ දී, ලිංගික දිශානතිය, සමාජභාවය, සමාජභාවී ප්‍රකාශන හෝ ලිංගික ලක්ශණයන් මත පදනම්ව කිසිවකු වෙනස් කොට සැලකීමෙන් වැලකිය යුතුය."

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, එහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය තුල, නීතිය ඉදිරියේ සමානාත්මතාවයට ඇති අයිතිය, සහ සියලු පුද්ගලයන් සඳහා නීතියේ සමාන ආරක්ෂාව සහතික කරයි (12 වැනි ව්‍යවස්ථාව). එය ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය සහ උපන් ස්ථානය මත වෙනස් කොට සැලකීම තහනම් කරන නමුත්, ලිංගික දිශානතිය, සමාජභාවය හෝ සමාජභාවී ප්‍රකාශන පදනම් කරගෙන වෙනස්කම් කිරීම තහනම් නොකරයි. එහෙත් ශ්‍රී ලංකා රජය විවිධ එක්සත් ජාතීන්ගේ ආයතන ඉදිරියේ පෙන්වා දී ඇත්තේ, 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) ව්‍යවස්ථාව යටතේ, වෙනස් කොට සැලකීමේ දී තහනම් වන හේතු සම්පූර්ණයෙන් දක්වා නොමැති බවත්, ලිංගික දිශානතිය පදනම් කරගෙන වෙනස් කොට සැලකීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල ව්‍යංගයෙන් තහනම් කර ඇති බවත්ය.[7]

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව:**

අ. නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේය.

ආ. කිසිම පුරවැසියෙකු, වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය, උපන් ස්ථානය, යන හේතු මත හෝ ඉන් කවර හෝ හේතුවක් මත හෝ වෙනස් කමකට හෝ විශේෂයකට හෝ භාජනය විය නොයුත්තේය.

[6] 365. යම් පුරුෂයෙකු, ස්ත්‍රියක හෝ සතෙකු සමග ස්වභාවධර්මයට විරුද්ධව, කැමැත්තෙන්ම කාමුක සංසර්ගයෙහි යෙදෙන තැනැත්තෙකුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කල යුතුය. ඔහු දඩයකටද යටත් කල යුතුය.
365 අ. ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ වෙනත් පුරුෂයෙකු සමග තදබල අශෝභන ක්‍රියාවක් කරන හෝ එබඳු ක්‍රියාවක් යම් පුරුෂයෙකු ලවා කරවන හෝ කරවීමට තැත් කරන හෝ පුරුෂයෙකු වරදකට වරදකාරයෙකු විය යුතුය. ඔහුට අවුරුදු දෙක දක්වා කාලයක, දෙයාකාරයෙන් එක ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකෙන්ම දඬුවම් කල යුතුය. එසේම කස පහර වලින් කරනු ලබන දඬුවමකට ද ඔහු යටත් විය යුතුය.

[7] 2019 පෙබරවාරි මස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ වාර්තාවේ 28 වැනි ඡේදය බලන්නඃ
https://tbinternet.ohchr.org/_layouts/15/treatybodyexternal/Download.aspx?symbolno=CCPR%2FC%2FLKA%2F6&Lang=en 2022 මැයි මාසයේ දී ඉදිරිපත් කර ඇති ආවර්තිතා වාර්තාවෙහි සඳහන් ගැටළු ලැයිස්තුවට, ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය දැක්වීමේදී 20 ඡේදය තුල එය නැවත අවධාරණය කර ඇතඃ
https://tbinternet.ohchr.org/_layouts/15/treatybodyexternal/Download.aspx?symbolno=CCPR%2FC%2FLKA%2FRQ%2F6&Lang=en

# IV. නිගමනය

ශ්‍රී ලංකාවේ NBTS ආයතනය විසින් දෙනු ලබන රුධිර පරිත්‍යාග පෝරමය තුල අසනු ලබන, පහත සඳහන් පිරිස් වලට රුධිරය පරිත්‍යාග කිරීමට නොහැකි බව දන්නේ ද, පරිත්‍යාගශීලියා සහ ඔහුගේ සහකාරයා පහත සඳහන් කුමන හෝ වර්ගයකට අයත් වේ ද, වැනි ප්‍රශ්න හරහා, රුධිර පරිත්‍යාගශීලියාගේ ලිංගික දිශානතිය පිළිබඳ තහවුරුවක් සිදු කරගනු ලබයි.[8]

රුධිර පරිත්‍යාගශීලියෙකු වීමේදී ඇතැම් අයට ඔවුන්ගේ ලිංගික දිශානතිය සම්බන්ධයෙන් වංක වීමට සිදුවන බැවින්, මෙම පෝරම මගින් ලැබෙන ප්‍රතිඵලය නිරවද්‍යයැයි කිව නොහැක්කේය. සිද්ධි අධ්‍යයනයේ දී පෙන්වා දී ඇති පරිදි, සමරිසි/ද්වි-රිසි පරිත්‍යාගශීලීන් MSM ලෙස පෝරමයේ සඳහන් නොකර, රුධිරය පරිත්‍යාග කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් මෙම ප්‍රශ්නවලට ඔවුන්ගේ ප්‍රතිචාරය වෙනස් කිරීම හරහා පෙන්නුම් කරන්නේ එම ප්‍රශ්නාවලියේ අවිධිමත් භාවිතයයි. සමහර පරිත්‍යාගශීලීන් තමන් MSM ලෙස සලකුණු කළත්, පුද්ගල අවදානම් තක්සේරුවකින් පසු රුධිරය පරිත්‍යාග කිරීමට අවසර දී ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිර්දේශ කර ඇති පරිදි, සෑම රුධිර පරිත්‍යාගයක්ම, NBTS විසින් HIV, හෙපටයිටිස් B සහ C, සිපිලිස් සහ මැලේරියා පරීක්ෂණයකට යොමු කරා බැවින්, ලිංගික දිශානතිය මත පදනම් වූ රුධිර පරිත්‍යාග තහනම් කිරීමේ අවශ්‍යතාවය ප්‍රතික්ෂේප වෙයි.

ශ්‍රී ලංකාවේ රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ නැවත සකස් කිරීමේ ප්‍රතිලාභ:

1. අවදානම්කාරී හැසිරීම් සම්බන්ධව අසා ඇති ප්‍රශ්න, ලිංගික දිශානතිය සම්බන්ධ කර නොගෙන, හුදෙක් පුද්ගල හැසිරීම් මත සම්බන්ධව විමසීමෙන් වඩා සත්‍ය සහ අවංක පිළිතුරු ලැබෙනු ඇති අතර, එමගින් රුධිර සාම්පල වල ගුණාත්මක භාවය ද වැඩි වනු ඇත.

2. පර්යේෂකයන් සොයාගෙන ඇත්තේ සමරිසි සම්බන්ධතා සහ HIV ගැන සමාජය තුළ පවතින නොයෙකුත් මත අඩු වීමෙන්, වැඩි පිරිසක් HIV සඳහා පරීක්ෂාවන් සිදු කර ගන්නා බවයි. සමාජභාවය සම්බන්ධ කොට නොගෙන ලේ දන්දීම සම්බන්ධව අලුතින් නිර්ණායක හඳුන්වාදීමෙන්, සමරිසි සහ/හෝ ද්වි-රිසි පිරිමින් වැඩිපුර HIV පරීක්ෂණ වෙත යොමු වනු ඇත.

3. රුධිර පරිත්‍යාගශීලීන් වැඩි වීමෙන්, සෞඛ්‍ය සම්පන්න ජනගහනයක් ඇති වේ.

4. පරීක්ෂණ සිදුකරගන්නා පිරිස වැඩි වීම හේතුවෙන් HIV පිළිබඳ සමාජ දැනුවත්භාවය ඉහළ යාම සහ එහි සම්ප්‍රේෂණය අඩු වීමට උපකාරී වනු ඇත.

5. සමාජයේ වැරදි මත සහ වෙනස් කොට සැලකීමේ අවස්තා අඩු වීම හේතුවෙන් MSM පිරිමි සහ ලිංගික ශ්‍රමිකයන්ගේ සෞඛ්‍යය සහ චිත්ත ධෛර්යය වැඩිදියුණු වනු ඇත.

[8] NBTS ලේ දන්දීමේ ප්‍රකාශය සහ වාර්තාවේ ප්‍රශ්න 6 (අ) සහ (ආ) (ඇමුණුම බලන්න)

# V. නිර්දේශ

## ජාතික රුධිර පාරවිලයන සේවය කළ යුතු දේ:

1. රුධිරය පරිත්‍යාග කිරීම පිළිබඳ පවතින මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම සහ MSM පිරිමි සහ ලිංගික ශ්‍රමිකයන්ව 'වෙනස් කොට සැලකීමක් ලෙස සැලකෙන' විධිවිධාන ඉවත් කිරීම.

2. ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට සහ ප්‍රමිතීන්ට අනුකූලව රුධිර පරිත්‍යාග කිරීම සඳහා සංශෝධිත නිර්ණායක හඳුන්වා දීම.

3. MSM ඇතුළු සියලුම රුධිර පරිත්‍යාගශීලීන්ට සහ ලිංගික ශ්‍රමිකයින්ට ගෞරවයෙන් සැලකීමට හැකි සංවේදී කාර්ය මණ්ඩලයක් රුධිර පරිත්‍යාග කඳවුරු වල සේවයෙහි යෙදවීම.

4. සෑම වර්ගයකටම අයත් පුද්ගලයන් අතර ලේ පරිත්‍යාග කිරීම ප්‍රවර්ධනය කරන්න.

5. සංශෝධිත රුධිර පරිත්‍යාගශීලී සුදුසුකම් නිර්ණායක සහ HIV පරීක්ෂාව පිළිබඳව, MSM සහ ලිංගික ශ්‍රමිකයින් ඇතුළු සියලුම රුධිර පරිත්‍යාගශීලීන් දැනුවත් කරන්න.

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කළ යුතු දේ:

1. රුධිර පරිත්‍යාග කිරීම සම්බන්ධයෙන් පවතින මාර්ගෝපදේශ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් ජාතික රුධිර පාරවිලයන සේවයට නිර්දේශයන් සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සැපයීම.

2. ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ප්‍රමිතීන්ට අනුකූලදැයි පරීක්ශා කිරීමට NBTS විසින් සකස් කරන ලද රුධිර පරිත්‍යාග පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශයන් සමාලෝචනය කිරීම

# ඇමුණුම 1 - ලොව පුරා සිදුවන ප්‍රතිපත්ති සංවර්ධනයන්

**ඇමරිකා එක්සත් ජනපදයේ:**

වර්තමාන ආහාර සහ ඖෂධ අධිකාරියෙහි ( FDA ) ප්‍රතිපත්තියට අනුව, සහකරු හැර වෙනත් අයෙකු සමග සිදු වූ ලිංගික එකතුවීමකින් මාස තුනකට පසු, ඔහු අනෙකුත් සුදුසුකම් ද සපුරා ඇත්නම්, සමරිසි සහ ද්විරිසි පිරිමින් සඳහා රුධිරය පරිත්‍යාගකිරීමට අවසර හිමි වේ.

කෙසේවෙතත්, 2023 ජනවාරි 27 වන දා FDA විසින් ඉදිරිපත් කල මාර්ගෝපදේශන කෙටුම්පත තුල ඔවුන් යෝජනා කරන්නේ, සමරිසි සහ ද්විරිසි පිරිමින්ට පනවා තිබූ මාස තුනක පමා කාලය අහෝසි කිරීමටයි. ඒ සඳහා එම අධිකාරිය විසින් HIV හි වත්මන් සම්ප්‍රේශණය ගැන ලබාගත් දත්ත හේතු විය. මෙම මාර්ගෝපදේශන කෙටුම්පත, සමාජභාවය හෝ ලිංගික දිශානතිය ගැන තැකීමකින් තොරව පුද්ගලයෙකුගේ පෞද්ගලික හැසිරීම ආශ්‍රයෙන් පමණක් රුධිර පරිත්‍යාග කිරීමේ හැකියාව තීරණය කෙරෙන රුධිර දන්දීමේ ආයතන බිහිකිරීමෙහි පලමු අඩියයි.

https://www.aabb.org/for-donors-patients/about-blood-donation/blood-donation-by-gay-and-bisexual-men

මෙම ප්‍රතිපත්තිය LGBTQ+ ප්‍රජාව තුළ බොහෝ දෙනෙකුට ඇති කර ඇති හානිය රතු කුරුස සංවිධානය හඳුනා ගන්නා අතර ලිංගික දිශානතිය මත පදනම් වූ ක්‍රම මගින් රුධිර පරිත්‍යාග සුදුසුකම් නිර්ණය නොකළ යුතු බව විශ්වාස කරයි. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා හවුල්කරුවන් සමඟ වැඩ කිරීමට අපි කැපවී සිටිමු.

https://www.redcrossblood.org/donate-blood/how-to-donate/eligibility-requirements/lgbtq-donors.html

**ඕස්ට්‍රේලියාවේ:**

වර්තමානය වන විට, MSM පිරිමින් රුධිරය පරිත්‍යාග කිරීමට නම් මාස තුනක පමා කාලයක් රැඳී සිටිය යුතුය. ඔවුන් මුඛසංසර්ගයෙහි යෙදී තිබුණ ද  මාස තුනක් යන තුරු ඔවුන් හට රුධිරය පරිත්‍යාග කිරීම සිදු කළ නොහැක්කේය. මෙම ප්‍රවේශය පෞද්ගලික හැසිරීම් පදනම් වූ අවදානම් තත්වයන් පරීක්ශා කිරීමට වඩා, ජනගහණය පදනම් වූ අවදානම්කාරී තත්වයන් පරීක්ශා කිරීමක් ලෙස හඳුනාගත හැක.

https://www1.racgp.org.au/newsgp/clinical/potential-blood-donation-changes-for-msm

**එක්සත් රාජධානියේ:**

පිරිමින් සමග සංසර්ගයෙහි යෙදෙන පිරිමින් සහ එකම සහකරු සමග මාස තුනක් හෝ ඊට වඩා සංසර්ගයෙහි යෙදෙන, සහ අපගේ අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරන සියලුම දෙනා හට රුධිරය පරිත්‍යාග කිරීමට අවස්තාව ලැබේ. යමෙකු, පසුගිය මාස තුන තුල, ඕනෑම නව සහකරුවෙකු හෝ සහකරුවන් සමග ගුද සංසර්ගයෙහි යෙදී ඇත්නම්, ඔවුන්ගේ සමාජභාවය හෝ ඔවුන්ගේ සහකරු(වන්)ගේ සමාජභාවය කුමක් වුව ද, ඔවුන් රුධිරය පරිත්‍යාග කිරීමට මාස තුනක් රැඳී සිටිය යුතුය.

අපි ඔබගේ රුධිර පරිත්‍යාග කිරිමට ඇති සුදුසුකම් තක්සේරු කර බලන්නේ ඔබගේ පෞද්ගලික අත්දැකීම් මත පමණි. එමගින් සැමට සාධාරණ ලෙස රුධිර පරිත්‍යාග ක්‍රියාවලින් සිදු වනු ඇත.

https://www.blood.co.uk/who-can-give-blood/men-who-have-sex-with-men/

**ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් රුධිර පරිත්‍යාගශීලින් තේරීම: රුධිර පරිත්‍යාග කිරීම සඳහා පරිත්‍යාගශීලියාගේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ මාර්ගෝපදේශ** (ජනවාරි 2012) -88 පිටුවේ

අධි අවදානමක් සහිත ලිංගික හැසිරීම් යනු, ලිංගික සහකරුවන් කිහිපදෙනෙකු සිටීම, මුදල් හෝ මත්ද්‍රව්‍ය වෙනුවෙන් හෝ මුදල් හෝ මත්ද්‍රව්‍ය වලින් ගෙවීම් සිදු කර ලිංගික සංසර්ගයෙහි යෙදීම, ලිංගික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ සේවාදායකයන්, පිරිමින් සමග ලිංගිකව එකතු වන පිරිමින් (MSM) (250,251) සහ MSM පිරිමින් සමග ලිංගිකව එකතු වන ගැහැණුන් වේ. (246,247,252). බොහෝ සංවර්ධිත රටවල HIV ආසාධිතයන්ගෙන් වැඩි කොටසක් MSM පිරිමින් (253,254,255,256) වන නිසා, බොහෝ රටවල සිදු වන්නේ ඔවුන්ව සදාකාලිකව රුධිර පරිත්‍යාගයෙන් වැලැක්වීමයි. (254,257,258).

මෙලෙස MSM පිරිමින් සදාකාලිකව රුධිර පරිත්‍යාගය වැලැක්වීමට කෙරෙන උත්සාහය, තෝරාගත් පිරිසකට කෙරෙනා වෙනස්කමක් ලෙසත්, විද්‍යාත්මක පසුබිමක් නොමැති තීරණයක් (253,259,260,261) ලෙසත් විවේචන එල්ල වේ. එසේම සමහර රටවල රුධිර පරිත්‍යාග පරීක්ෂාවකට යටත් කිරීම සඳහා (249,262), අධි සංවේදී සහ විශ්වාසදායක තාක්ෂණයන් යටතේ මෙම තත්වය විවිධ අයුරින් සමාලෝචනයට භාජනය වී ඇත. MSM සඳහා රුධිර පරිත්‍යාගය වැලැක්වෙන කාල පරතරයන් වසරක් හෝ පහක් දක්වා අඩු කිරීමෙන් සිදු වන බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා සිදු කරන අධ්‍යයනයන් යෝජනා කර ඇති පරිදි, HIV ආසාදිත පරිත්‍යාගයක් රුධිර සැපයුමට ඇතුළු වීමේ අවදානම ඉතා සුළු වන නමුත් ශුන්‍ය නොවන බවත් ය. (263,264,265,266) මෙම අධ්‍යයනයන් සමහර උපකල්පන මත රඳා පවතින අතර, ඒවා රඳා පවතින්නේ අධ්‍යයනය කරන ලද ජනගහනයට පමණක් වේ.. කෙසේ වෙතත්, දැනට සංසන්දනාත්මකව සිදු කරන ලැබූ සාක්ෂි නොමැත. MSM පිරිමින් සදාකාලිකව රුධිර පරිත්‍යාගයෙන් වැලැක්වීම, සිදුවන්නේ "හැකිතරම් අවම ලෙස පවත්වාගෙන යාමේ" ප්‍රතිපත්තියට අනුවය.

https://www.who.int/publications/i/item/9789241548519

## ඇමුණුම II: රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ සහ ප්‍රකාශය

ජාතික රුධිර පාරවිලයන සේවය

# රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ

පිටුපසින් ඇති ලේ දන්දීමේ පෝරමය පිරවීමට පෙර කරුණාකර මෙම මාර්ගෝපදේශ හොඳින් කියවන්න.

### රුධිර පරිත්‍යාගශීලියෙකු වීමට,

ඔබ...,

- වයස අවුරුදු 18 ට වැඩි සහ අවුරුදු 60 ට අඩු, (පළමු වරට පරිත්‍යාග කිරීම නම් අවුරුදු 55 ට අඩු විය යුතුය)
- බර කිලෝග්‍රෑම් 50 ට වැඩි,
- පෙර පරිත්‍යාග කළේ නම්, පෙර පරිත්‍යාග කළ දින සිට අවම වශයෙන් මාස 4 ක් ගත වී ඇති,
- හිමොග්ලොබින් මට්ටම 12ට g/dl ට වැඩි,
- ඕනෑම බරපතල රෝග තත්ත්වයකින් හෝ ගැබ්ගැනීම් වලින් නිදහස්,
- විදේශගතව සිට පැමිණියේ නම්, ලංකාවට පැමිණි දින සිට අවම වශයෙන් මාස තුනක්වත් ගත වී ඇති,
- "අවදානම්කාරී හැසිරීම්" වලින් නිදහස්,

පුද්ගලයෙකු විය යුතුය.

### රුධිරය පරිත්‍යාග කිරීමට පෙර ඔබ කළ යුත්තේ,

- පැය හතරක් ඇතුළත ප්‍රධාන ආහාර වේලක් ගෙන තිබිය යුතුය.
- වැඩිපුර දියර වර්ග පානය කරන්න. (මත්පැන් හැර)
- පෙර දින අවම වශයෙන් පැය හයකට වඩා නිදාගන්න
- සුවපහසු ඇඳුමක් ඇඳගෙන පැමිණෙන්න.

### අවදානම් හැසිරීම්

- ලිංගික සහකරුවන් එක් අයෙකුට වඩා හිඳීම.
- පිරිමියෙකු නම් වෙනත් පිරිමියෙකු සමඟ ලිංගිකව එක්ව තිබීම.
- අවම වශයෙන් එක් වරක් ලිංගික ශ්‍රමිකයෙකු ලෙස සේවයේ නියැලී තිබීම.
- පසුගිය වසර තුළ, අවදානම් ලිංගික හැසිරීම් වල යෙදී තිබීම.
- අවම වශයෙන් එක් වරක් හෝ කටු හරහා මත්ද්‍රව්‍ය එන්නත් කරගෙන තිබීම.

### රුධිරය පරිත්‍යාග කිරීමෙන් පසු ඔබ කළ යුත්තේ,

- අවම වශයෙන් විනාඩි 20 ක්වත් රුධිර පරිත්‍යාග මධ්‍යස්ථානයේ රැඳී සිටින්න
- කුඩා ආහාරයක් සහ බීම (දියර) ගන්න.
- ඉදිරි පැය හතර තුළ වැඩිපුර දියර වර්ග පානය කරන්න.
- එන්නත් කළ ස්ථානයෙන් පැය 12 ක් යනතුරු ප්ලාස්ටර් ඉවත් නොකළ යුතුය.
- රුධිරය ගන්නා ලද අත භාවිතයෙන්, බර වැඩ කිරීම හෝ අධික බර ඉසිලීම නොකළ යුතුය.

දැනුවත්ව රෝගයක් පැතිරවීම ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 262,263 වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි.

**ලේ බිඳක් පරිත්‍යාග කරන්න - ජීවිතයක් බේරා ගන්න**

ජීවිත බේරා ගැනීම සඳහා ඔබ කරන සේවය අපි අගය කරමු

විමසීම්

**ජාතික රුධිර මධ්‍යස්ථානය**

අංක 555/5D, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.

දුරකථන: 011 23 69 931 ෆැක්ස්: 011 23 69 937/011 23 69 939

විද්‍යුත් තැපැල: info@nbts.health.gov.lk

වෙබ් අඩවිය: nbts.health.gov.lk

# ජාතික රුධිර පාරවිලයන සේවය
# ලේ දන්දීමේ ප්‍රකාශය සහ වාර්තාව

ඔබේ ආරක්ෂාව සහ ඔබේ රුධිරය ලබා ගන්නා රෝගීන්ගේ ආරක්ෂාව සඳහා කරුණාකර ඔබ විසින්ම මෙම පෝරමය නිවැරදිව පුරවන්න. පෝරමය පිරවීමට පෙර, කරුණාකර පළමු පිටුවේ ඇති රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ කියවා තේරුම් ගන්න. ඔබට වැඩිදුර විමසීම් හෝ ගැටළු ඇත්නම් කරුණාකර ජාතික ලේ දන්දීමේ සේවයේ කාර්ය මණ්ඩලය අමතන්න.

1. a) ඔබ මීට පෙර රුධිරය පරිත්‍යාග කර තිබේද? ඔව් ☐ නෑ ☐

   b) එසේ නම්, කොපමණ වාරයක් ද? ...................

   c) ඔබ රුධිරය පරිත්‍යාග කළ අවසන් දිනය ....................................................

   d) ඔබ මීට පෙර රුධිරය පරිත්‍යාග කිරීමේදී කිසියම් දුෂ්කරතාවයකට මුහුණ දී තිබේද? ඔව් ☐ නෑ ☐

   e) එසේ නම්, ඔබ මුහුණ දුන් දුෂ්කරතාවය කුමක්ද?.....................................

   f) වෛද්‍යවරයකු විසින් රුධිරය පරිත්‍යාග නොකරන ලෙස ඔබට උපදෙස් දී තිබේද..? ඔව් ☐ නෑ ☐

   g) අද ඔබට ලැබුණු "රුධිර පරිත්‍යාග මාර්ගෝපදේශ" ඔබ කියවා තේරුම් ගත්තාද? ඔව් ☐ නෑ ☐

2.

   a) ඔබ හොඳ සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිනවාද? ඔව් ☐ නෑ ☐

   b) ඔබ කවදා හෝ පහත සඳහන් රෝගවලින් පීඩා විඳ තිබේද? එසේ නම් කරුණාකර ඉදිරිපස කොටුවේ x ලකුණු කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| හෘද රෝග | ☐ | දියවැඩියාව | ☐ | පිළිකා | ☐ |
| අංශභාගය | ☐ | ඇදුම/ පෙනහළු රෝග | ☐ | අපස්මාරය | ☐ |
| වකුගඩු රෝග | ☐ | රුධිර සංකූලතා | ☐ | අක්මා රෝග | ☐ |

   c) ඔබ යම් ආකාරයක ඖෂධ හෝ ප්‍රතිකාර ගන්නවාද? ඔව් ☐ නෑ ☐

   d) ඔබ යම් සැත්කමක් කර තිබේද්? ඔව් ☐ නෑ ☐

   e) රුධිරය පරිත්‍යාග කිරීමෙන් පසු ඔබට බර වැඩ කිරීමට, පොදු ප්‍රවාහන වාහනයක් පැදවීමට, උස් ස්ථානවල වැඩ කිරීමට, කඳු නැගීම, බර යන්ත්‍ර සූත්‍ර ක්‍රියාත්මක කිරීමට හෝ එවැනි වැඩ කිරීමට සිදුවේද? ඔව් ☐ නෑ ☐

   f) ඔබ ගැබ්ගෙනද? ඔබ මව් කිරි දෙනවාද..? පසුගිය මාස 12 තුළ ඔබ දරු ප්‍රසූතියක් හෝ ගබ්සාවක් සිදුවී තිබේද?.............................. ඔව් ☐ නෑ ☐

3. a. ඔබ කවදා හෝ කහ උණ / හෙපටයිටිස් වලින් පීඩා විඳ ඇත්ද..? ඔව් ☐ නෑ ☐

b. පසුගිය වසර දෙක තුළ ඔබ ක්ෂය රෝගය / උණ සන්නිපාතය රෝගයට ගොදුරු වී ප්‍රතිකාර ලබා තිබේද? ඔව් ☐ නෑ ☐

4. පසුගිය මාස 12 තුළ,

a. ඔබ ප්‍රතිශක්තිකරණය හෝ වෙනත් අරමුණක් සඳහා එන්නත් කර තිබේද? ඔව් ☐ නෑ ☐

b. ඔබ යම් විදීමක්, පච්ච කෙටීමක් හෝ කටු චිකිත්සාවක් සිදු කර තිබේද? ඔව් ☐ නෑ ☐

c. ඔබ සිරගත කර තිබේද? ඔව් ☐ නෑ ☐

d. ඔබ හෝ ඔබේ සහකරු විදේශගත වී තිබේද? ඔව් ☐ නෑ ☐

e. ඔබට හෝ ඔබේ සහකරුට රුධිරය හෝ රුධිර කොටස් ලබාදී තිබේද? ඔව් ☐ නෑ ☐

f. ඔබ මැලේරියාවෙන් පීඩා විඳ, ඒ සඳහා ප්‍රතිකාර ලබාගෙන තිබේද? ඔව් ☐ නෑ ☐

5. අ) ඔබ පසුගිය මාස 6 තුළ ඩෙංගු උණ රෝගයට ගොදුරු වී හෝ ප්‍රතිකාර ලබා ගෙන තිබේද? ඔව් ☐ නෑ ☐

ආ) ඔබ චිකන්පොක්ස්, සරම්ප, කම්මුල්ගාය වැනි රෝග වලින් පීඩා විඳ තිබේද, රුබෙල්ලා උණ, පාචනය හෝ වෙනත් දිගුකාලීන (සතියකට වඩා වැඩි) උණ මගින් පීඩා විඳ තිබේද..? ඔව් ☐ නෑ ☐

ඇ) ඔබ පසුගිය සතියේ දත් උගුල්ලා/ ඉවත් කර තිබේද? ඔව් ☐ නෑ ☐

ඈ) ඔබ පසුගිය සතියේ ප්‍රතිජීවක හෝ ඇස්ප්‍රින් හෝ වෙනත් ඖෂධ ලබා ගත්තාද? ඔව් ☐ නෑ ☐

6. a. ඔබ පහත සඳහන් කාණ්ඩවලට අයත් වන්නේ නම් ඔබ ලේ පරිත්‍යාග කිරීමට සුදුසුකම් නොලබන බව ඔබ දන්නවාද? ඔව් ☐ නෑ ☐

- ඔබට HIV/AIDS හෝ Hepatitis B/C තිබේ නම්
- ඔබට ලිංගික සහකරුවන් එකකට වඩා සිටී නම්
- ඔබ පිරිමියෙක් නම් සහ ඔබ වෙනත් පිරිමියෙකු සමඟ ලිංගිකව එක්වී ඇත්නම්
- ඔබ ඔබේ ශරීරයට මත්ද්‍රව්‍ය එන්නත් කර ඇත්නම්
- ඔබ ලිංගික ශ්‍රමිකයෙකු ලෙස සේවයේ යෙදී ඇත්නම්
- ඔබ පසුගිය මාස 12 තුළ ලිංගික ශ්‍රමිකයෙකුගේ සේවය ලබාගෙන තිබේ නම්
- ඔබට හෝ ඔබේ සහකරුට HIV/AIDS හෝ වෙනත් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග ආසාදනය වී ඇති බවට සැකයක් ඇත්නම්.

b. ඔබ හෝ ඔබේ සහකරු ඉහත කාණ්ඩවලට අයත්ද? ඔව් ☐ නෑ ☐

c. ඔබ බර අඩු වීම, වසා ග්‍රන්ථි ඉදිමීම හෝ දිගු කාලයක් පවතින උණ හෝ පාචනය වැනි රෝගවලින් පෙළෙනවාද? ඔව් ☐ නෑ ☐

<table>
<tr><td colspan="4">**සම්පූර්ණ නම:**<br>**(ජාතික හැඳුනුම්පතට අනුව)**</td><td colspan="2">**පිරිමි** ☐ **ගැහැණු** ☐</td></tr>
<tr><td colspan="3">**ජාතික හැඳුනුම්පත් අංකය:**</td><td colspan="2">**උපන්දිනය:**</td><td>**වයස:**</td></tr>
<tr><td colspan="6">**නිවසේ ලිපිනය (ස්ථිර/තාවකාලික):**</td></tr>
<tr><td colspan="3">**විද්‍යුත් තැපැල:**</td><td colspan="3">**ලේ වර්ගය:**</td></tr>
<tr><td colspan="6">**කාර්යාල ලිපිනය:**</td></tr>
<tr><td>**දුරකථන අංකය**</td><td>**නිවස:**</td><td colspan="2">**කාර්යාලය:**</td><td colspan="2">**ජංගම දුරකථන:**</td></tr>
</table>

**රුධිර පරිත්‍යාගශීලීන්ගේ ප්‍රකාශය**

- පුද්ගලික ලාභ අපේක්ෂාවකින් තොරව රුධිරය පරිත්‍යාග කිරීමට, මම එකඟ වන අතර මා විසින් පරිත්‍යාග කරන රුධිරය ශ්‍රී ලංකා ජාතික රුධිර පාරවිලයන සේවය මගින් රෝගීන්ගේ අභිවෘද්ධිය සඳහා භාවිත කිරීමට එකඟ වෙමි.
- රුධිරය පරිත්‍යාග කිරීමෙන් පසු ජාතික රුධිර පාරවිලයන සේවයේ මාර්ගෝපදේශ හා උපදෙස් පිළිපැදීමට මම එකඟ වන අතර, මාර්ගෝපදේශ අනුගමනය නොකලහොත් පැමිණෙන ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් මම වගකීම භාරගනිමි.
- මගේ රුධිරය HIV/AIDS, Hepatitis B, සහ C, Syphilis, මැලේරියාව, හෝ අවශ්‍ය යැයි සිතිය හැකි වෙනත් පරීක්ෂණ සඳහා පරීක්ෂා කිරීමට ඉඩ දීමට මම එකඟ වෙමි.
- ඉහත පරීක්ෂණවල ප්‍රතිඵල පිළිබඳ දැනුවත් වීමට මම එකඟ වෙමි; හර්ගී විසින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කිරීමට මම එකඟ වෙමි.
- මම පෝරමය සහ මාර්ගෝපදේශ හොඳින් කියවා තේරුම් ගෙන ඇති අතර පෝරමයේ ඇති ප්‍රශ්නවලට මා ලබා දී ඇති පිළිතුරු වල සත්‍ය බව මම සහතික කරමි.
- දැනුවත්ව රෝග පැතිරීම ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 262 සහ 263 වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් බව මා දන්නා බව මම පිළිගනිමි.

**ඉදිරියේදී ස්ථිර සහ ජීවිත කාලය පුරාවටම රුධිර පරිත්‍යාගශීලියෙකු ලෙස ලේ අවශ්‍ය රෝගීන්ට ලබාදීමට මා කැමතිය.**

**සෑම මාස 4 කට වරක්** ☐ **සෑම මාස 6 කට වරක්** ☐ **වසරකට වරක්** ☐

| | | |
|---|---|---|
| ...................................................... | ..................................... | ......................................................... |
| **රුධිර පරිත්‍යාගශීලියාගේ නම** | **අත්සන** | **දිනය** |

## රුධිර පරිත්‍යාග වාර්තාව - කාර්යාලීය භාවිතය සඳහා පමණි

**ලියාපදිංචි කිරීම**

ඉහත පරිත්‍යාගශීලියාගේ නම සහ හැඳුනුම්පත් අංකය තහවුරු කර තිබේද..? ඔව් ☐ නැත ☐

DIN නිකුත් කරන නිලධාරියාගේ අත්සන ......................................................

Bar Code

බර (kg):

**වෛද්‍ය තක්සේරුව** (වෛද්‍ය නිලධාරියාගේ අත්සන ................................................)

රුධිර දායකයාගේ නම ..........................................................................................................................................

**වෛද්‍ය ඉතිහාසය** නිරෝගී ද? / ප්‍රමාණවත් රාත්‍රී නින්ද (> පැය 6)/අවසන් ආහාර වේල <පැය 4 / කවදා හෝ රෝහල් ගත කර තිබේද? / කිසියම් අසාත්මිකතා, නිධන්ගත රෝග හෝ ප්‍රතිකාර..?/ අවදානම්කාරී හැසිරීම්..? (Q6 සමාලෝචනය)

**විභාගය III** පෙනුම හෝ සුදුමැලි ගතියක්..? / සෙංගමාලය / මත්පැන් සුවඳ / ආසාධිත තුවාල / එන්නත් කිරීම් මගින් සිදුවූ තුවාල දක්නට ලැබේද...?

CVS ස්පන්දනය: /මිනි රුධිර පීඩනය: /mmHg සටහන් : ..............................................

**උපදේශනය:** අවශ්‍යනම් CUE සඳහා යොමු වීම : ☐ PD වෙත දැනුම් දෙන්න : ☐

**ප්‍රතිඵලය** : >12.5g/dl නම් පමණක් රුධිර පරිත්‍යාග කිරීමට හැක ☐ තාවකාලිකව නොහැක ☐ ස්ථීරව නොහැක ☐

---

**Hb පරීක්ෂණය සහ BAG නිකුත් කිරීම** (නිලධාරියාගේ අත්සන .............................................................)

ලියාපදිංචි වීමට පෙර පරිත්‍යාගශීලියාගේ නම සහ හැඳුනුම්පත් අංකය නිවැරදි දැයි පරීක්ෂා කරන්න

Hb මට්ටම : >12.5 g/dl ☐ <12.5 g/dl ☐ රුධිර බෑග් වර්ගය: Q ☐ T ☐ D ☐ S ☐

---

**රුධිර එකතු කිරීම** (Phlebotomist ගේ අත්සන ............................................................................... ..)

පරිත්‍යාගශීලියාගේ නම සහ රුධිර බෑග් අංකය නිවැරදි දැයි පරීක්ෂා කරන්න.

ලේ පරිත්‍යාග කිරීම ආරම්භ වූ වේලාව: ............................... අවසන් වූ වෙලාව: .......................... රුධිර ප්‍රමාණය :.........................

ලේ ලබා ගත් පුද්ගලයාගේ අත්සන: ......................................................

CM අංකය:

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතිඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ශිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.


www.bridge2equality.org

bridgetoequalitycampaign@protonmail.com

facebook.com/BridgetoEquality

instagram.com/bridgetoequality2021

twitter.com/B2ECampaign

youtube.com/@bridgetoequality